## II කොටස

මෙම කොටසින් (2), (3) ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2 අ). පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

එක් අවධියක භාවිත වන භාෂාව හැමදා එකසේ නොපවතින්නේ ඇයි? සීගිරි සිංහලයෙන් හෝ අදත් නොලියන්නේ කවර හෙයින්ද? මීට මූලික ම හේතුව නම්, භාෂාව භාවිත කරන ජනතාව වෙනස් වීමයි. භාෂාව වූ කලී ජනතාවක් සතු අදහස් උදහස්, ඕනෑ එපාකම්, සිතුම් පැතුම්, දුක් දොම්නස් ප්‍රකාශ කරන මාධ්‍යයයි. පරම්පරාවෙන් පරම්පරාවට මිනිසුන්ගේ අදහස් උදහස්, සිතුම් පැතුම් ආදිය වෙනස් වන විට ඊට අනුකූල වන පරිදි ඔවුන්ගේ භාෂාව ද වෙනස් වීම වැළැක්විය නොහැක්කකි. අවධියෙන් අවධියට භාෂාව වෙනස් වීමට තවත් හේතු සාධක ඇත්තේය. මේ හේතු සාධක සියල්ල අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වේ. අභ්‍යන්තර හේතු යනු භාෂා ව්‍යවහාරයෙන්ම පැන නගින හේතුයි. බාහිර හේතු යනු භාෂාවෙන් පරිබාහිර වූ දේශපාලනික, ආර්ථික, සාමාජික ආදී සාධක නිසා පැන නගින හේතුයි. අභ්‍යන්තර හේතු යනු සුඛෝච්චාරණය, සරලකරණය, ප්‍රමාද දෝෂ යනාදියයි. බාහිර හේතු යනු වෙනත් භාෂාවක බලපෑම, තාක්ෂණික අවශ්‍යතා, ජනමාධ්‍යයේ නැගීම, වාණිජ ලෝකයේ ව්‍යාප්තිය වැනි හේතුයි. කවර ම භාෂාවක හෝ පරිණාමයට හේතු විය මේ සාධක සිංහල භාෂාව කෙරේ ද අඩු වැඩි වශයෙන් බලපා ඇති බව පෙනේ.

1. එක් අවධියක භාවිත වන භාෂාව හැමදා එකසේ නොපවතින්නේ ඇයි?
2. ඡේදයේ සඳහන් ආකාරයට භාෂාව හඳුන්වා ඇත්තේ කෙසේද?
3. සීගිරි හෝ පොලොන්නරු සිංහලයෙන් අදත් නොලියන්නේ කවර හෙයින් ද?
4. අවධියෙන් අවධියට භාෂාව වෙනස් වීමට හේතු වන අනෙක් සාධක කීයක් තිබේද?
5. අභ්‍යන්තර හේතු යනු මොනවාද?
6. බාහිර හේතු යනු මොනවාද?

**(ලකුණු 12යි)**

2 ආ). පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ඇතැම් පරීක්ෂණ වලදී ක්ෂේත්‍ර අධ්‍යයනය අත්‍යවශ්‍ය වෙයි. කලා අංශයට හා විද්‍යා අංශයට අයත් සමහර පර්යේෂණවල දී විශ්ව විද්‍යාලයීය පුස්තකාලය තුළ දී එම පර්යේෂණවලට අදාළ අවශ්‍ය අධ්‍යයන කටයුතු කළ හැකිය. එහෙත් ජනගහණය, නගර නිර්මාණය, ගමනාගමනය, කෘෂිකර්මය, වැනි ඇතැම් ක්ෂේත්‍රවලට අයත් සමහර පර්යේෂණ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය අනිවාර්යයෙන්ම කළ යුතු වෙයි. ක්ෂේත්‍ර අධ්‍යයනය යනුවෙන් බොහෝ විට හැඟවෙන්නේ කිසියම් පර්යේෂණයක දත්ත රැස් කිරීම හා සාමාන්‍ය නිරීක්ෂණ අවස්ථාව ය. සත්‍ය වශයෙන්ම හෝ ස්ථිර වශයෙන් දන්නා වූ ද පර්යේෂකයෙකු නිගමනයන්ට එළඹීම සඳහා ඉවහල් කරගන්නා වූ ද කරුණු හැඟවීම පිණිස දිත්ති යන පාරිභාෂිකය යෙදේ. අදාළ පුද්ගලයන් හමු වීමෙන් හෝ අවස්ථාවන්ට සහභාගී වීමෙන් ද ස්ථාන කරා එළඹීමෙන් ද නැතහොත් තැපැල් මාර්ගික ප්‍රශ්නාවලි මගින් පර්යේෂකයා සිය අධ්‍යයනයට අදාළ තොරතුරු එක් රැස් කරයි. ප්‍රත්‍යක්ෂයෙන් සත්‍ය යැයි දැනගත් එබඳු කරුණු ඇසුරෙනි ඔහු නිගමනවලට බසිනුයේ.

ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා මූලික පුහුණුවක් ලබා ගත යුතු ය. නිරීක්ෂකයා තම ගවේෂණයට හසුකර ගන්නා අවස්ථාවන්ට සහභාගීවීමේ පමණට හා ඒවා හසුරුවා ගන්නා තරමට ක්ෂේත්‍ර අධ්‍යයනය විවධ වෙයි. සමහර පර්යේෂණයක දී තම ගවේෂණයට හසු වූ විශයයන් සෑම එකක් ගැන ම අවධානය යොමු කළ යුතු ය. ජාත්‍රයා කවර වර්ගයකට අයත් පර්යේෂණයක් කරගෙන යායුතු ද යන්න රඳා පවතින්නේ ඔහුගේ විෂය, කාලය, බැහැරින් ලැබෙන ආධාර උපකාර හා භාවිතයට ලැබී ඇති උපකරණ යන මේවායේ ස්වරූපය මතයි. අනෙක් සාධකය නම් සිය සොයාගැනීම් පදනම් කර සාධාරණීකරණයට ඔහු කැමති වන ප්‍රමාණය ය. ප්‍රත්‍යෙක අධ්‍යන වැනි ඇතැම් පරීක්ෂණ සඳහා විවිධ වූත් වෙනස් වූත්
පර්යේෂණ ක්‍රම ඇඳා ගත යුතු යි. **(ලකුණු 15යි)**

3. ඇති මාතෘකා වලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

1. වසංගත රෝග ව්‍යාප්තිය නිසා අකර්මන්‍යව ඇති ලාංකික පාසල් අධ්‍යාපනය නගා සිටුවීමට ගත හැකි ක්‍රියාමාර්ග
2. රටක අපරාධ හා අපචාර මර්දනයේදී ජනමාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය
3. වන සම්පත හා වන සතුන් ආරක්ෂා කිරීම කාලෝචිත අවශ්‍යතාවකි
4. ආනයනික භාණ්ඩ සීමා කිරීමෙන් රටේ ආර්ථිකයට වන බලපෑම
5. නූතන සමාජ ගැටළු හමුවේ අභියෝගයට ලක්වන ශ්‍රී ලාංකේය චාරිත්‍ර-වාරිත්‍ර

**(ලකුණු 25යි)**

4. අ). පහත සඳහන් වාක්‍යවල සදොස් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. තරංගාවලිය සඳහා දක්ෂ සිසුහු පැමිණ ඇත.
2. ඇමතිවරුන් සත්‍යය කීහයි කවුරුත් විශ්වාස කරත්ද?
3. මම දෙවියන් දකින්නේ කවරදා ද?
4. ගුණමකුවෙක් සේ වැඩ නොකරන්න
5. සෞඛ්‍ය සේවකයෝ හෙට වැඩට ඒවි

**(ලකුණු 1x5-05)**

ආ). පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

1. කෙටිකතාකරුවෝ විවිධ අත්දැකීම් පාදක කොට ගෙන කෙටි කතා ලියූහ.
2. මිත්තණිය මා නැළෙව්වාය.
3. ගුරුවරු අධ්‍යාපනය හැදෑරීමෙහි ලා සිසුන් දිරිමත් කරති.
4. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු රෝගීන් රෝහලට යොමු කරති.
5. ජනාධිපතිතුමා ව්‍යාපාරිකයන් ඇමතුවේය.

**(ලකුණු 1x5-05)**

ඇ). නිවැරදි වැකියක් නිර්මාණය කිරීමට යෝග්‍ය පද වරහන් තුළින් තෝරා ලියන්න.

1. (වන සතුන්/වන සත්තු) ගම් වදිතීයි (ගැමියෝ/ගැමියන්) බියෙන් පසුවෙති.
2. (මිනිස්සු/මිනිසුන්) කැලෑ කපද්දී (පරිසරවේදීන්/පරිසරවේදීහු) එතැනට ගියහ.
3. (සාමාජිකයන්/සාමාජිකයෝ) ආවොත් (අපි/අප) රැස්වීම පවත්වමු.
4. සොයුරිය හා සොහොයුරු සමග (මම/මා) ද උත්සවයට සහභාගී (වීමු/වීමි).
5. ඇතැමෙක් (සිසුන්/සිසුහු) ලවා ගෙදර වැඩ (කරති/කරවති).

**(ලකුණු 1x5-05)**

5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

1. වැද්දා **ඔබිනොබ සරන වනසතුන්** ඉලක්ක කර හීයක් විද්දේය.

(ඔබිනොබ - සන්ධි, සරන - කෘදන්ත, වනසතුන් - සමාස)

2. **චිරන්තන** වාරි විද්‍යාත්මක නිර්මාණ නූතන ඉංජිනේරුවන් **පවා** මවිත **කරවයි.**

(චිරන්තන - තද්ධිත, පවා - නිපාත, කරවයි - ක්‍රියා)

3. **සුළඟින් සෙලවුණු** කොඩිවැල **ක්‍රීඩාභූමියෙහි** පතිත විය.

(සුළඟින් - විභක්ති, සෙලවුණු - කෘදන්ත, ක්‍රීඩාභූමියෙහි - විභක්ති)

4. **බමුණාණෝ සූර්යෝදය** ට පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ.

(බමුණාණෝ - තද්ධිත, සූර්යෝදය - සන්ධි, ගංගානදිය - සමාස)

5. **දෙසබසරුිස** නගනු වස් මහමෙහෙයක් **කළ කුමාරතුඟුවෝ** හෙළහවුල ඇරඹූහ.

(දෙසබසරුිස - සමාස, කළ - කෘදන්ත, කුමාරතුඟුවෝ - විභක්ති)

**(ලකුණු 3x5=15)**

6. අ). පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට අර්ථානුකූලව වඩාත්ම ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

1. භාෂාව .................... පරිහරණය කිරීමෙන් එහි ජීව ගුණය රැකීමට හේතුවක් වේ.
2. අනාදිමත් කාලයක සිට .................... කෘෂිකර්මය ලංකා ආර්ථිකයේ වැදගත් තැනක් ගෙන ඇත.
3. .................... කියවිය හැකි සන්දේශ සිංහල සන්දේශ වලින් සුලබ නොවේ.
4. විදේශීය ණය ආධාර මත .................... රටක සංවර්ධනයට බාධාවක් නොවේ.
5. මහ බැංකුව .................... තොරතුරු සැපයීම තුළින් මහජනයාට ආර්ථිකට පිළිබඳ අවබෝධයක් ලැබේ. 6. පැරණි සමාජය වූ කලී .................... සමාජයකි.

**(අල්පේච්ඡ, නිවැරදි, යැපුම්, නිරවද්‍ය, නවතායෙන්, යැපීම)**

**(ලකුණු 1/2x6=03)**

ආ). පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

1. පස් + සාලිස්
2. කථා + උපකථන
3. සැරි + පුත්
4. දෙ + අත
5. සුරු + අතින්
6. කර්ණ + ඉන්ද්‍රිය

**(ලකුණු 1/2x6=03)**

ඉ). තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

1. වන සතුන් **වනයෙන්** පිටවන වේලාව ගැන අපට **මාර්ගෝපදේශකයා** පැහැදිලි කළේය.

2. **තම** වරප්‍රසාද රැක ගැනීම **පාලකයාගේ** ඒකායන අරමුණ විය.

3. **දරුවෙනි,** සෑම විට **දහමෙහි** හැසිරෙන්න.

**(ලකුණු 1/2x6=03)**

ඊ). සුදුසු විරාම ලක්ෂණ යොදා පහත වාක්‍ය නැවත ලියන්න.

1. මෙහි එව රජ නියෝග කළේය

2. පුත ඔබ බෝසත්වරයෙකි ඔබට බුදු බව ලැබේවා

3. සමාජයේ පවතින අපරාධ මිනීමැරුම් මත්ද්‍රව්‍ය පාලනයට දැඩි නීති සැකසිය යුතුය

**(ලකුණු 1/2x6=03)**

උ). පහත දැක්වෙන එක් එක් ප්‍රකාශවල ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

1. "මම මගේ කාර්යය නීත්‍යානුකූලව ඉටු කරමි" යි මුදල් ඇමතිතුමා නිවේදනය කළේය.

2. "ළමයිනි, නිතරම දෑත් පිරිසිදුව තබාගන්න" යි ගුරුතුමා කීවේය.

3. "අපි මතින් තොර තරුණ පරපුරක් බිහි කරනවා" යැයි මන්ත්‍රීවරු කියති.

**(ලකුණු 1/2x6=03)**

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

අනුරූප පද සංයෝග නීතිය ක්‍රියාත්මක කළහොත් **ව්‍යතිමිශ්‍ර** සමාසවල උපප්‍රභේදයක් ලෙස සැලකිය යුතු විශේෂ ප්‍රයෝග සෑහෙන ප්‍රමාණයක් ව්‍යවහාරයෙන් මැකී යයි. මේ උප ප්‍රභේදය නම් **නෛරුක්තික** ප්‍රවර්ග දෙකකින් ගත් එකම අර්ථය සහිත ප්‍රකෘති යුගල සංඝටනය කිරීමෙන් සිද්ධි ප්‍රතිරාව සමාසයි. **ප්‍රතිරාව** සමාසයෙක ලක්ෂණය වනුයේ භාෂාවේ පවත්නා පුරාතන තද්භව ප්‍රකෘතියක අර්ථය වඩාත් පැහැදිලි ව **සන්නිවේදනය** කිරීම සඳහා ඒ අර්ථයම ප්‍රතිරාව නංවන **තත්සම** ප්‍රකෘතියක් සමග මුලින් කී තද්භව ප්‍රකෘතිය **සංඝටනය** කිරීමයි. විළි ලජ්ජාව, පඬුරු පාක්කුඩම්, කෙළි සෙල්ලම්, ලයිට් එළිය ආදී නිදසුන් සමුදායයන් මේ සඳහා දැක්විය හැකිය. මේ නිදසුන් අනුව පැහැදිලි වන්නේ විෂම නෛරුක්තික ප්‍රවර්ග දෙකකට අයත් **ප්‍රකෘති** දෙකක් අන්තර්ගතවීම ප්‍රතිරාව සාමාසයෙක එක්තරා අනන්‍යතා ලක්ෂණයක් බව යි. එබැවින් ඊනියා අනුරූප සංයෝග නීතිය රකින්නකුට ප්‍රතිරාව සමාස ව්‍යවහාර කිරීමට අවකාශයක් නොලැබේ.

1. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

2. නෛරුක්තික, සමුදාය, අනුරූප යන වචනවල යෙදී ඇති පිල්ලම් වෙනස ලියන්න.

3. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

   1 අනුස්වාරය හා මහප්‍රාණ අක්ෂරයක් යෙදුන වචනයක්

   2 ඕෂ්ඨජ අක්ෂරයක් හා මූර්ධජ අක්ෂරයක් යෙදුන වචනයක්

   3 අන්තස්ථ අක්ෂරයක් හා මූර්ධජ අක්ෂරයක් එක ළඟ යෙදුන වචනයක්

4. ඉහත ඡේදයෙන් උපසර්ග සහිත පද 3 ක් වෙන්කර ලියන්න.

5. පුරාතන, නෛරුක්තික, අවකාශයක් යන පදවල තද්ධිත ප්‍රත්‍ය වෙන් කර ලියන්න.

**(ලකුණු 3x5-15)**

8. පහත සඳහන් මාතෘකා වලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. විශේෂණ සමාසය
2. අනම්‍යකරණය
3. ප්‍රායෝජ්‍ය ක්‍රියා
4. ස්වර සන්ධිය
5. කර්තෘකාරක කෘදන්ත

**(ලකුණු 5x3-15)**